
වීර සහෝදරයින් සිව් දෙනා

I කොටස

# ශීත ඍතුවට දොරටුවක්



නෙත්මි ආකර්ෂා දිසානායක

# ශීත සෘතුවට දොරටුවක්

## නෙත්මි ආකර්ෂා දිසානායක

කතෘ

කතෘගේ වෙනත් කෘති

පුංචි ටිකිරි

මහාමායා බාලිකා විද්‍යාලය,
මහනුවර.
7 ශ්‍රේණිය

ISBN - 978-624-208-990-4

10.05.2026

# පිදුම

මා හට සියළු සම්පත් ලබාදෙමින්
මාගේ ලෝකයට එළියක් වෙමින්,
මා දිරිමත් කළ
මාගේ දෙමාපියන් මෙන්ම
මාගේ පාසලේ විදුහල්පතිතුමියත්
ගුරු මව්පියන්ටත්
පුදමි මේ පොත් පිංච
හදපිරි සතුටින්



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි.  මේ සදහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,

ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.

සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.

2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා භාරිකාව විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු  දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.


ප්‍රදීප් නිලංග දෑල,

දියවඩන නිලමේ,

ශ්‍රී දළදා මාලිගාව


2026.05.10

# ශීත සෘතුවට දොරටුවක්

එකමත් එක කාලෙක ජූලි කියලා ගැහැණු ළමයෙක් හිටියා. එයාට රොබින් සහ ටෝනි කියලා අයියලා දෙන්නෙකුයි ශෙලීනා කියලා අක්කා කෙනෙකුයි හිටියා.

මෙයාලා එයාලාගේ ලස්සන විශාල ගෙදර තමයි හිටියේ. මේ ගෙදර කාමර ගොඩක් තිබුණා. ඒ අතරින් "ඇතුල්වීම තහනම්" යනුවෙන් එක කාමරයක ලියා තිබුණා.



එක දවසක් ජූලි සහ ශෙලීනා, රොබින්, ටෝනි හැංගි මුත්තම් කරමින් සිටියා. එවිට ජූලි හට නම් සැඟවීමට ස්ථානයක් තිබුණේ නැත, එවිට ඇයගේ සිහියට නැගුනේ ඇතුල්වීම තහනම් යනුවෙන් ලියා ඇති කාමරයයි. ජූලි එතනට දිව ගියේ සැඟවීමටයි.



ජූලි එය විවෘත කළාය. පුදුමයකි. එහි කුමක් හෝ දෙයක් රෙදි කැබැල්ලකින් වසා තිබිණි. ජූලි එම රෙදි කැබැල්ල විවෘත කළාය. එතැන අල්මාරියක් තිබිණි. රෙදි කැබැල්ලකින් අල්මාරිය වසන්නේ චාරිත්‍රයකට යැයි සිතා ගත් ඇය. අල්මාරිය විවෘත කර යාංතමින් එය ඇතුලට රිංගා ගත්තාය.



එවිට ඇය බලාපොරොත්තු වූ රෙදි පිලිනම් දක්නට නොතිබුණේ ය. ඇය පිටුපසට ගමන් කරමින් සිටියාය. සීතල යමක් ඇගේ හිසේ ගෑවෙන්නාක් මෙන් දැනුන විගස ඇය පිටුපස හැරී බැලුවොය. "WOW" ඇගේ මුවින් පිට විය. එය හිම ලෝකයකි. ඒ අසල පිහිටියේ කහ බල්බයක් දැල් වූ කළු පාට කණුවකි. ඇය පුදුමයෙන් පුදුමයට පත් වී ටික වේලාවක් එහි චමත්කාරය වින්දාය.



සර සර හඬක් ඇගේ පිටුපසින් තිබුණු කළුපාට කඳක් සහිත තැනින් තැන ඝන හිමවලින් වැසුණු දැවැන්ත ගසක් පිටුපසින් ඇසෙන්නට විය. ජූලිගේ සිත තිගැස්සී ගියේ රාක්ෂයෙක් දුටුවා මෙනි. කවුද ඔතන මෙතෙක් වෙලා නිශ්ශබ්දව සිටි ජූලි කුතුහලයෙන් ඇසුවාය.

ඇය කෙමෙන් කෙමෙන් වෘක්ෂය වෙත ළඟා වුවාය. ශරීරයේ පහළ කොටස පිනි මුවෙක් ලෙසත් ඉහළ කොටස මිනිසෙක් ලෙසත් ඇති තෑගි අතින් රැගත් අයෙක් විය. ඔහු ජූලිට බිය වී තෑගී බිම වට්ටා ගත්තේය. ජූලි ඒවා අහුලා දුන්නාය. ස්තූතියි ළමයෝ. මගේ නම ජැක්. ඔහු කීවේය.

“කොහොමද ජැක් අන්කල් මගේ නම ජූලි” ඔයා මෙහෙ අතරමන් වෙලා ද ජූලි. ජැක් ඇසුවේය.




දැනට නම් නෑ මම අතරමන් වුන ගමන් ඔයාට ඇමතුමක් දෙන්නම් ඔයාට ඇමතුම් අංකයක් තියනවා ද ටිකක් වෙලා නිශ්ශබ්දතාවයක් පැවතුනි.

හරි ඒ වයින් වැඩක් නෑ. එන්න මගේ ගෙදරට මම ඔයාව එක්කගෙන යන්නම් ජැක් කීවේය. ජූලි සහ ජැක් සීතල හිම මතින් පා පතිත කරමින් දැවැන්ත ගසක් ළගට ආවෝය. ජූලි මේ මගේ ගෙදර මේ ජූලි පුදුමයෙන් කීවාය. ගස මැද ලොකු බෙනයකි. එය ජැක්ගේ නිවහනයි. ජූලි සහ ජැකි එය තුළට ගියහ.



එහි සාමාන්‍ය නිවසක් මෙන් සියලු පහසුකම් තිබිනි. ජැක් ජූලිට තේ කෝප්පයක් දුන්නේ ය. මේ තේ නම් හරිම රසයි ජූලි කීවාය.

එම නිවස ඇතුළත අලංකාරය පිළිඹිබු වන සේ සකසා තිබිණි. තව විස්කෝතු දෙන්න ද ජූලි ? ජැක් ඇසුවේය. හා. එව්වා ගොඩක් රසයි. ඔයාට හොඳට විස්කෝතු හදන්න පුළුවන් වගේ. ජූලි කීවාය. ඔවුන් ජැක් සෑදූ රසකෑම වර්ග කමින් රසවත් කතා කියමින් කාලය ගත කළහ.



අපොයි ! මට වෙලා ගිහින්. එකපාරටම ජූලි කීවාය. ජූලි මම ඔයාව ඇරලවන්න ද? ජැක් ඇසුවේය. එපා. මට පාර මතකයි. ජූලි ජැක්ට සමුදී ගෙදරට පිටත් වූවාය. ජූලි තම නිවසට එනවිටත් ජූලිව තම සහෝදර සහෝදරයින් සොයමින් සිටියා. ඇයි ඉක්මනින් එතැනට දිවගොස් මම මෙතැන යැයි කීවාය. ඔවුහු ජූලි සතුටින් වැළඳ ගත්හ. ඔවුන් නින්දට යන්න ද ලෑස්ති වූහ. ජූලි නින්දට යන්න පෙර තම ශෙලීනා සොයුරිය අමතා මෙම මායා දොරටුව ගැන කියන්නට විය.



උදෑසනම ශෙලීනා රොබින්ට සහ ටෝනිට මෙම මායා දොරටුව ගැන කීවාය. ඔවුන් ජූලි සමගම හිම ලෝකයට ගියහ. ජැක් ද හමුවූවාය. ඔවුන් ආපසු තම නිවසටද පැමිණියෝය.

ඔවුන් දිනපතාම එහි පැමිණෙයි. ඔවුන් ජැක් ව හමුවී ජැක් සෑදූ රසවත් ආහාර ද භුක්ති විඳියි. ඔවුන් එකිනෙකා අතර ආහාර ද හුවමාරු කරගයි. දවසක් ජූලි ජැක්ට අරුම පුදුමු ආහාරයක් සකස් කොට දුන්නාය. ඒ ජැකි ආසම චොකලට් කේක් එකකි.



ඔවුන් ආහාර හුවමාරු කරගත්හ. ඔවුන් මෙම මායා දොරටුව ඇතුළත තිබෙන මායා ලෝකය ගැන දන්නා නිසා ඔවුන්ට නත්තලට ද අපූරු තෑගි ලැබුණා. මොවුන් දිනපතාම සතුටින් කාලය ගත කලත් මෙම දොරටුව භාවිත නොකරන ලෙස මව උපදෙස් දුන්නත් පුංචි ළමුන් මේ දොර වැසුවේ නැත. එයින් අනතුරක් වූයේ ද නැත. නමුත් කාලයත් සමගම එහි ඇති මායා දොරටුවේ මායාව මැකී ගියේය.



# පසුවදන



අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකරවීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල් නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස්වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **“හේමමාලා උපහාර”** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තූතිවන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)

ISBN - 978-624-208-990-4